GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/08/11

## මාධ්‍ය නිවේදනයයි

අවුරුදු 88ක් පැරණි රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මේ දක්වා වෛද්‍යවරු විශාල සංඛ්‍යාවක් මේ රට තුල රඳවා ගැනීම සඳහා දායක වී ඇත. එය අන් වෘත්තියවේදීන්ට ආදර්ශයකි. එපමණක් නොව බහුතරයක් වෛද්‍යවරුන් රාජ්‍ය අංශයේ රඳවා ගැනීමට අප සංගමය සමත් වී ඇත. මේ නිසා අප රට තුල බටහිර රටවල් හා සැසඳිය හැකි ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් නොමිලේ සැපයීමට හැකි වී ඇත.

ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් රටේ යම් ප්‍රදේශවලට පමණක් වුයේ නම් එය ඵලදායි නොවනු ඇත. ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් රට පුරා හැකි උපරිම සමානාත්මතාවයෙන් යුතුව සැලසීමට හැකියාව ලැබෙන පරිදි වෛද්‍යවරු රට පුරා ස්ථානගත කිරීමට අප කටයුතු කර ඇත. ඒ සඳහා වෛද්‍ය මාරුවීම් ප්‍රතිපත්ති වෙනුවෙන් අප දැඩිව පෙනී සිට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස රට පුරා සෞඛ්‍ය දර්ශක බොහෝ දුරට සමානව පවතී. ඉන් කොළඹ පමණක් නොව දුර බැහැර සියලු වැසියන්ට නිසි ඵල ලබා දී ඇත.

මෙවන් මාරුවීම් ප්‍රතිපත්තියක් දේශපාලන හෝ අනිකුත් බලපෑම් වලට යටත් නොවී පවත්වාගෙන යාම අප රටේ අසීරු කටයුත්තක් බව අමුතුවෙන් කිවයුතු නැත. මහජනතාව වෙනුවෙන් මාරුවීම් ප්‍රතිපත්ති ආරක්ෂා කර ගැනීමට යාමේදී විවිධ මට්ටමේ ප්‍රභූන් යැයි හඳුන්වා ගන්නා අය ඉදිරියේ අප ජනප්‍රිය පිරිසක් ලෙස කැපී පෙනීමකට ලක් නොවිනි.

යුද්ධය පැවති කාලයේදී පවා රජයේ වෛද්‍යවරු මෙම ප්‍රදේශ වලට අප අනුයුක්ත කලෙමු. සාමාන්‍යයෙන් යුද්ධයක් පවතිද්දී වෛද්‍ය සේවා සපයන්නේ රාජ්‍ය නොවන සංවිධාන වලින් අනුයුක්ත කරන වෛද්‍යවරුන් විසිනි. රජයේ වෛද්‍යවරුන් යුද්ධය පැවති ප්‍රදේශ වල ස්ථාන ගත කිරීමට අප ගත් පියවර නිසා සෞඛ්‍ය දර්ශක යුද ප්‍රදේශ වල අන් ප්‍රදේශ හා සැසඳිය හැකි මට්ටමක පැවතුණි.

මේ හේතුවෙන් රටේ යම් ජන කොටසකට අයුතු ලෙස සැලකු බවට ගෙන යන ප්‍රචාර බිඳ වැටුණි. එවන් ජාතික මෙහෙවරක් සිදු කල අප සංගමයේ පසුගිය මාස 02 තුල මාරුවීම් ප්‍රතිපත්ති අකර්මන්‍යව තිබුණි.

පසුගිය වසර 02 තුලදී විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය මහතාගේ දැඩි මැදිහත්වීම මැද කාර්‍යක්ෂම කරන්නට පියවර ගැනුණි.

1. පරිඝණක තාක්ෂණය භාවිතා කර අයදුම් කිරීම
2. මාරුවීම් ප්‍රතිපත්තිය පරිඝණක ආධාරයෙන් ක්‍රියාත්මක කිරීම.
3. වෛද්‍යවරුන්ගේ දත්ත ගබඩාවක් පරිඝණක ආධාරයෙන් සැලසීම.

මේ හේතුවෙන් මාස 10 - 12ක් පමණ ගතවු මාරුවීම් සැකසීම දින 10 - 14 ක් වැනි කෙටි කාලයක් දක්වා අඩුවී කාර්‍යක්ෂම විය. මේ හේතුවෙන් ඉතිහාසයේ පලමු වරට සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාරුවීම් නියෝග දෙසැම්බර් 31ට ප්‍රථම වෙබ් අඩවිය මගින් වෛද්‍යවරුන්ට දැනුම් දෙන ලදි.

අප සංගමය මාස 02ක් අකර්මන්‍ය වීම නිසා අඩාල වු 2015 වාර්ෂික මාරුවීම් හැකි ඉක්මනින් කාර්‍යක්ෂම කිරීම සඳහා මහා සභාව රැස් කර ඇත.

ස්තුතියි,

වෛද්‍ය ලසන්ත ජිනදාස
ලේකම්

**වැඩිදුර විස්තර සඳහා :** වෛද්‍ය සමන්ත ආනන්ද - 0777666301
වෛද්‍ය නවීන් සොයිසා - 0718582444